# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2273/84 - 2022 අප්‍රේල් මස 01 වැනි සිකුරාදා - 2022.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රාදේශීය ලේකම් ගොනු අංකය*: බෙන්/2/7/3/29.
*ඉඩම් අමාත්‍යාංශයේ ගොනු අංකය* : 4-3/05/2018/HA/454.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 02ඒ - වරාහේන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, "වරාහේන" ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක ගා 4617 හා 2021/12/31 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කරන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.7141 ක් (අක්.01, රූඩ් 03, පර්.2.3) වූ පහත විස්තර කෙරෙන "බණ්ඩාරවත්ත, ලුණුකැරුව සහ වරාහේන වත්ත හෙවත් මහබණ්ඩාරවත්ත" නැමැති ඉඩම් කැබලි එකට (01):

01. **කැබලි අංක 01**

ඉඩමේ නම:බණ්ඩාරවත්ත, ලුණුකැරුව සහ වරාහේන වත්ත හෙවත් මහබණ්ඩාරවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත, මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා:මංගලිකා අමරසිංහ, අංක 03, පොලිස් පාර්ක් පෙදෙස, කොළඹ 05. ලක්ෂ්මි ගිරන්තනී අභයකෝන් සහ තවත් අය, අංක 306/2, ඒකක 04, 06 වැනි මහල, කෝට්ටේ පාර, නුගේගොඩ.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 අප්‍රේල් මස 27 වැනි දින පූ.භා. 10.00 ට බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022 අප්‍රේල් මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

බන්දුල ප්‍රීතිරාජ් අබේසේකර,
ප්‍රාදේශීය ලේකම්,
බෙන්තොට.

2022 මාර්තු මස 29 වැනි දින,
බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 04 - 0006


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 36536 - 19 (2022/03)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.